# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2111/41 – 2019 පෙබරවාරි 21 වැනි බ්‍රහස්පතින්දා – 2019.02.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2019 අංක 33 දරන ආඥාව**

*මගේ යොමු අංකය*: 4-3/9/2017/ඩබ්එස්/542.
*ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය*: ඩීඑස්බී/එල්එන්ඩී/03/එෆ්අයි/40.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

**ගයන්ත කරුණාතිලක,**
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2019 පෙබරවාරි මස 13 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
මිහිකත මැදුර,
අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.** – ප්‍රාදේශීය ලේකම්, බෙලිඅත්ත.

2. **ඉඩමේ විස්තරය –** දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දකුණු ගිරුවා පත්තුව සුළු කොට්ඨාසයේ, නාකුළුගමුව (අ.ග.පි. 302) ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක එච්/බීඑල්ඒ/2018/154 හා 2018.06.07 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම් වලින් හා ප්‍රමාණවලින් යුත් ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – කොස්වත්ත නොහොත් සියඹලාගස්ආර, දංගහවත්ත නොහොත් සිද්දියාගේ වත්ත – ප්‍රමාණය: හෙක්. 0.2023**

උතුරට: කේ. එච්. පියදාස හිමිකම් කියන වෙරළාච්චිගෙවත්ත, කේ. එච්. අසේල සමන්ත හිමිකම් කියන කිරිකොස්ගහහේන සහ ඒ. උබයසේන හිමිකම් කියන කිරිකොස්ගහහේන; නැගෙනහිරට: කේ. එච්. අසේල සමන්ත

හිමිකම් කියන කිරිකොස්ගහහේන සහ ඒ. උබයසේන හිමිකම් කියන කිරිකොස්ගහහේන, මාර්ගය සහ තිස්ස වීරතුංග හිමිකම් කියන කොස්වත්ත නොහොත් සියඹලාගස් ආර, දංගහවත්ත නොහොත් සිද්ධියාගේ වත්ත; දකුණට: තිස්ස වීරතුංග හිමිකම් කියන කොස්වත්ත නොහොත් සියඹලාගස් ආර, දංගහවත්ත නොහොත් සිද්ධියාගේ වත්ත; බටහිරට: කේ. එච්. පියදාස හිමිකම් කියන වෙරළාච්චිගෙවත්ත, කේ. එච්. අසේල සමන්ත හිමිකම් කියන කිරිකොස්ගහහේන සහ ඒ. උබයසේන හිමිකම් කියන කිරිකොස්ගහහේන.

03 - 352

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2019 අංක 32 දරන ආඥාව**

*මගේ යොමු අංකය*: 4-3/9/2014/ඩබ්එස්/02.
*ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය*:
ටීඑච්අයි/එල්එන්ඩී/එල්2/ඒසීකිව්වීඅයි/119.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම, පහත සඳහන් උපලේඛනයේ I වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ II වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2019 පෙබරවාරි මස 13 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
මිහිකත මැදුර,
අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.** – ප්‍රාදේශීය ලේකම්, තිහගොඩ.

2. **ඉඩමේ විස්තරය** – දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගඟබඩ පත්තුව සුළු කොට්ඨාසයේ, කිතලගම ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් එම්ආර්/ටීඑච්ජී/2017/462 හා 2018.04.23 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම් වලින් හා ප්‍රමාණයෙන් යුත් ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – මැදවත්තහේන – ප්‍රමාණය: හෙක්. 0.1373ක් පමණ**

උතුරට: මාර්ගය සහ බැස්ටියන් කහඳගමගේ හිමිකම් කියන මැදවත්තහේන; නැගෙනහිරට: බැස්ටියන් කහඳගමගේ හිමිකම් කියන මැදවත්තහේන, කමල් රාමනායක හිමිකම් කියන ඉඩම සහ කැබලි අක්ෂර බී; දකුණට: කැබලි අක්ෂර බී සහ මාර්ගය; බටහිරට: මාර්ගය.

03 - 353

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.